කටාන ප්‍රාදේශීය සභාව
--------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
---------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 09 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2015 දෙසැම්බර් 31 දිනට කටාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.
----------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාවේ ස්වයං උත්පාදිත ආදායම් නොවන මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල්, මුදල් පදනම මත ගිණුම් තැබීම ප්‍රතිපත්තිය වුවද, ලැබීමට ඇති උසාවි දඩ රු.20,760,391 ක් හා මුද්දර ගාස්තු රු.89,994,273 ක් උපචිත පදනම මත ගිණුම් ගතකර තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු , හිමිකම් සහ ජංගම වගකීම් යන ශේෂ පත්‍ර අයිතමයන් 03 ක් සඳහා ලබාදී තිබූ සටහන් වල වටිනාකම, ශේෂ පත්‍රයේ මුහුණත සඳහන් වටිනාකම සමඟ නොසැසඳුණු අතර, වෙනස රු.184,445 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු.27,310,000 ක් වටිනා ස්ථාවර වත්කම් , ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායක වීමේ ගිණුම වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමට බැර කොට තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට තොග සමීක්ෂණයන් සිදුකර අවසන් තොගය ගිණුම් ගතකල යුතු වුවත්, ආයුර්වේද වෛද්‍යවරයාගෙන් ලබාගන්නා වාර්තාව පදනම් කරගෙන ආයුර්වේද බෙහෙත් අවසන් තොගය රු.702,463 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.555,229 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුළ ව්‍යාපෘති 11 කට අදාලව රු.142,324 ක් වූ නොපියවූ අත්තිකාරම්මුදලක් ඇතුලත් විය. මෙම

අත්තිකාරම් මුදල් 1997, 2001 හා 2002 වර්ෂවලදී ලබාදී තිබුණද, මෙම වටිනාකම නැවත ප්‍රතිපූර්ණය වීමක් සිදු නොවන බව සභාව විසින් හඳුනාගෙන තිබුණ ද තවදුරටත් අත්තිකාරම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් 31 දිනට රද්දොළුගම උපකාර්යාලයට අයත් බැංකු ගිණුමේ බැංකු ප්‍රකාශය අනුව බැංකුවේ ශේෂය රු.909,285 ක් වූ අතර, පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට බැංකු ශේෂය රු.989,037 ක් විය. වෙනස වූ රු.79,752 බැංකු සැසඳුම ගලපා නොතිබුණි.

(ඊ) දිගින් දිගටම පැවත එන රු.18,730 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය කලින් ලද ආදායම් වලින් අඩුකර පෙන්වීමෙන් කලින් ලද ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව අතැති තොගය රු.4,210,970 ක් වුවත්, උපලේඛණ හා පොත්පත් අනුව ශේෂය රු.5,594,565 ක් වූයෙන් රු.1,383,595 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම

(අ) 2000, 2006, 2007 හා 2011 වර්ෂවලදී විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය සහ මිය ගිය සේවකයන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.115,226 ක සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමි අවසන් ශේෂය තුල 2013 වර්ෂයට අදාලව රු.2,554,130 ක් ද 2014 වර්ෂයට අදාලව රු.36,533,465 ක් ද නිරවුල් කිරීමට කටයුතු නොකොට දිගින් දිගටම පැවතෙමින් තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

එකතුව රු.10,693,947 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා ලේඛණ හා විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 නොසැසඳු පාලන ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 09 කට අදාළව ගිණුම හා උපලේඛන අතර රු.1,992,541 ක වෙනස්කම් විය.

1.3.6 බලය නොලත් ගණුදෙනු

(අ) ජර්නල් සටහන් අංක 29 මගින් රු.22,789,700 ක් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට බැර සටහනක් ලෙස ගලපා තිබුණි.

(ආ) ජර්නල් සටහන් අංක 9 හා අංක.10 මගින් අගරු චෙක්පත් රු.17,390 ක්ද, වංචා කරන ලද මුදල් ලෙස සඳහන් රු.16,127 ක්ද විධිමත් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුකල අගය මත බදු ගිණුමේ රු.6,901,798 ක ශේෂය ජර්නල් සටහන් අංක.08 මගින් සමුච්චිත අරමුදල් ගිණුමට වටිනාකම් හඳුනා ගැනීමකින් තොරව කපාහැර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.71,737,440 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.72,968,988ක් විය.

2.2 ආදායම් පරිපාලනය
--------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය
----------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|
| | '000 රු. | '000 රු. | '000 රු. |
| වරිපනම් හා වරෙන්තු ගාස්තු | 45,907 | 53,340 | 35,529 |
| බදු කුලී | 819 | 1,121 | 41 |
| බලපත්‍ර ගාස්තු | 695 | 947 | - |
| වෙනත් ආදායම් | 23,068 | 10,430 | 35 |
| මුළු එකතුව | 70,489 | 65,838 | 35,605 |

2.2.2 වරිපනම් බදු
---------------

කටාන ප්‍රාදේශීය සභාවට අයත් රද්දොලුව උප කාර්යාලයේ වරිපනම් ඒකක 13324 ක්ද, දෙමංහන්දිය උප කාර්යාලයේ වරිපනම් ඒකක 26462 ක්ද, කටාන උප කාර්යාලයේ වරිපනම් ඒකක 14058 ක්ද, ආඬිඅම්බලම උප කාර්යාලයේ වරිපනම් ඒකක 11715 කටද අදාලව වරිපනම් ලේඛණ නඩත්තු කර නොතිබූ අතර, වරිපනම් බදු හිඟ ශේෂවලට අදාල කාල විශ්ලේෂණ ලබාගැනීමට ද නොහැකි වී තිබුණි.

2.2.3 ඉඩම විකුණුම් මත ගාස්තු
-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක.15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව නියම විකුණුම් මිළ මත බදු අයකරගත යුතු වුවත්, දේපල වෙළඳ සමාගම් 07 ක් ඉඩම් කොටස් කර විකිණීම් කර ඇති නමුත්, නියම විකුණුම් මිළ මත බද්ද අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) දෙමංහන්දිය තේක්කවත්ත වෙන්දේසි ඉඩම තුල සමෘද්ධි,පවුල් සෞඛ්‍ය සේවා හා ග්‍රාම සේවා කාර්යාලයක් ස්ථානගතව තිබුණද ඒවා මඟින් සභාව ලැබූ ආදායම් පිළිබඳ විස්තර විගණනයට තහවුරු නොවුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනඇගයීම

------------------------

2015 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් ක්‍රියාකාරකම් 33 ක් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය මාසික මුදල් ශේෂය රු.12,952,908 ක් වුවද මෙම මුදල් ආයෝජනය කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) 2015 මාර්තු 20 දින රු.28,000 ක් වියදම් කර රද්දොළුව නිවාස යෝජනා ක්‍රමයේ අන්තරාකාරී මාරගසක් කපා ඉවත් කර රාජ්‍ය දැව සංස්ථාව වෙත රැගෙන ගොස් ඇති අතර 2016 ජූනි 30 වන විටත් ඒ සඳහා කිසිදු මුදලක් සභාවට ලැබී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

3.3.1 ප්ලාස්ටික් බාල්දි මිළදී ගැනීම

---------------------------------

2015 පෙබරවාරි මස එකක් රු.300.79 බැගින් ප්ලාස්ටික් බාල්දි 5924 ක් මිළදී ගැනීම සඳහා රු.1,999,720 ක මුදලක් ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ගෙවීම් කර තිබුණි. ඒ සම්බන්ධ පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 මාර්තු 27 දින පැවති මාසික සභා රැස්වීමේදී මෙම මිළදී ගැනීම සඳහා අවශ්‍ය අනුමැතියක් ලබා ගැනීම සුදුසු බව පිළිගෙන තිබුණද එවැනි අනුමැතියක් ලැබී නොතිබුණි.

(ii) ඉහත මිලදී ගැනීමෙන් මාස 08 කට පසුවත් එනම් 2015 ඔක්තෝබර් මස ප්ලාස්ටික් බාල්දි එකක් රු.250 බැගින් එකතු කල අගය මත බදු රහිත මුදලකට කටාන විවිධ සේවා සමූපකාර සමිතියෙන් මිළදී ගෙන තිබු අතර, 2015 පෙබරවාරි මස කාල වකවානුව තුළ මිලදී ගැනීම් සිදු කිරිමේදී කටාන විවිධ සේවා සමූපකාර සමිතිය මගින් විමසීම් කර නොතිබූ හෙයින් එසේ විමසීම් කර එම සමිතියෙන් මිලදි ගත්තේ නම් සභාවට රු.301,498 ක ඉතිරියක් කල හැකිව තිබුණි.

3.4 කොන්ත්‍රාත් පාලනය

------------------------

(අ) මහහුණුපිටිය නුගවැල පාර ප්‍රාදේශීය සභා ඉඩමේ බහු කාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම-iv පියවර.

-------------------------------------------------------------------------------------------

ඉහත කර්මාන්තය ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් රු. 993,666 ක වටිනාකමකට මාස 03 ක කාලයකින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2015 නොවැම්බර් 17 දින ගිවිසුම් ගතවී තිබුණි.

පහත කරුණු අනාවරණය විය.

(i) කොන්ත්‍රාත්කරු විසින් කර්මාන්තයේ වැඩ සියයට 80 ක් අවසන් බව දක්වා තිබුණද එය සම්පූර්ණ ගොඩනැගිල්ලේ ඉදිකිරීමක් වන හෙයින් iv වන අදියරේ ඉදිකිරීම් ප්‍රමාණය නොවූණ අතර ඒ පිළිබඳව අදාල බලධාරින් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ii) කටාන ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණක විසින් 2016 මාර්තු 29 දින සියයට 20 ක අත්තිකාරම් මුදල නිදහස් කිරීමේදී දින 17 ක් ඇතුළත කර්මාන්තය නිමකල හැකිද යන්න පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ එකඟතාවයකට පැමිණිය යුතු බව දන්වා තිබුණද, එයට පටහැනිව එදිනම එනම් 2016 මාර්තු 29 දින රු.198,733 ක අත්තිකාරම් මුදලක් ගෙවාතිබුණි.

(iii) කෙසේ වුවද විගණිත දිනය වූ 2016 මැයි 16 දිනවනවිටත් කර්මාන්තය නිමකර නොතිබුණි.

(iv) ඒ අනුව මහහුණුපිටිය බහුකාර්ය ගොඩනැගිල්ලේ iii අදියරේ වැඩකටයුතු අවසන් කිරීමට ප්‍රථම iv වන අදියරේ වැඩ කටයුතු පවරා රු.198,733 ක් ගෙවීම් කිරීම හේතුවෙන් කර්මාන්තයේ iii හා iv අදියර දෙකෙහිම ඉදිකිරීම් කටයුතු පමාවී තිබුණි.

(ආ) ප්‍රමාද වූ ව්‍යාපෘති
--------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට ඇස්තමේන්තු කල දින 100 සංවර්ධන වැඩසටහන යටතේ රු.69,718,727 ක් වටිනාකමැති ව්‍යාපෘති 70 ක් නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. එයින් රු.11,000,000 ක් වටිනා ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම් ගතවී ඇති කර්මාන්ත අතරින් වටිනාකම රු.2,696,766 ක් වූ කර්මාන්ත 03 ක් ඉටුකර නොතිබූ අතර, රු.4,410,000 ක් වූ කර්මාන්ත 03 ක් අවලංගු කර තිබුණි.

(iii) කටාන ප්‍රාදේශීය සභා ඉඩමේ රථගාලක් ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී රු.483,905 ක වටිනාකමට කොන්ත්‍රාත්කරුවකු සමඟ සභාවේ ලේකම් විසින් ගිවිසුම්ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉදිකිරීම් කටයුතු ඉටුකර නොතිබුණි.

3.5 පාරිසරික ගැටළු
--------------------
පහත තොරතුරු අනාවරණය විය.

(අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වෙනි වගන්තිය යටතේ වූ නියමයෙහි උපලේඛණ 2 හි 4.1 ඡේදය යටතේ සෑම අලුත්කිරීමේ අයදුම්පත්‍රයක්ම බලපත්‍ර කාලය අවසන් වන දිනයට යටත් පිරිසෙයින් තුන් මසකට පෙර අදාල පළාත් පාලන ආයතනය වෙත ඉදිරිපත් කළයුතු වුවත්, එලෙස සිදුකර නොතිබූ අතර, ඒ පිළිබඳ අධීක්ෂණයක්ද සිදුකර නොතිබුණි. තවද වලංගු කාලය ඉකුත් වී ඉල්ලුම්පත්‍ද ඉදිරිපත් නොකර පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර 06 ක් තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.මෙලෙස කටයුතු කිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් ලබා ගැනීමට සභා නිලධාරින් කටයුතු කර නොතිබුණි.

(ආ) තවද ඉහත නියමයෙහි 4.2 වගන්තිය යටතේ තාක්ෂණික ප්‍රගති සමාලෝචන කමිටුව විසින් මසකට වරක් ඉහත කටයුතු වල ප්‍රගතිය සමාලෝචනය කර වාර්තා කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.6 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාර, සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය